**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව - 2019**
**-----------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් හා සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම් | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හි 32 ඡේදය ප්‍රකාරව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයක් මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටක හැර වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් නොකළ යුතුය. එසේ වුවද, 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු නියෝජිත කොමිස් ගිණුමේ පැවති රු.මිලියන 13.46 ක හර ශේෂ එදිනට රු.මිලියන 45.15 ක් වූ බැර ශේෂවලට එරෙහිවද, විදේශ විනිමය ලාභ හා පාඩු ගිණුමේ පැවති රු.මිලියන 14.3 ක බැර ශේෂය එදිනට වෙනත් මෙහෙයුම් වියදම් ගිණුමේ පැවති රු.මිලියන 984.74 ක් වූ හර ශේෂයට එරෙහිවද හිලව් කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නියෝජිත කොමිස් ගිණුමේ පවතින නොසැසඳුන හර ශේෂය 2011 වසරට පෙර සිට පවතින පැරණි ශේෂයක් බව, ඉදිරියේදී ප්‍රමාණාත්මක විදේශ විනිමය ලාභ ඇත්නම් වෙනත් ආදායම් යටතේ දැක්වීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. 2020 වර්ෂයේදී මෙම වැරදි නිවැරදි කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 2 හි 36 (අ) ඡේදය ප්‍රකාරව, භාවිතා කළ පිරිවැය සූත්‍රයද ඇතුලුව තොග මැනීමේදී යොදා ගත් ගිණුම්කරන ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද, ඔසුසැල්වල ඉතිරි තොග සම්බන්ධයෙන් එම හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි. | සංස්ථාව පිරිවැය සූත්‍රයක් භාවිතා නොකරන අතර වෙළඳපල මිල මට්ටම හා අනෙකුත් ඖෂධ වෙළඳපල තත්ත්ව සලකා බලා ඖෂධ මිල තීරණය කරන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. 2020 වර්ෂයේදී මෙම වැරදි නිවැරදි කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 හි 36(ආ) හා 38 ඡේද ප්‍රකාරව, ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනස්වීමක බලපෑම ඉදිරි කාලීනව හඳුනාගැනීම සඳහා ගනුදෙනු, වෙනත් සිදුවීම් සහ | මෝටර් රථ සම්පූර්ණයෙන් ක්ෂයවී තිබීම නිවැරදි කිරීම ඇස්තමේන්තුවක් ප්‍රතිශෝධනය කිරීමක් නොව වැරදි නිවැරදි | -එම- |

| | | |
|---|---|---|
| තත්ත්වයන්ට ඇස්තමේන්තුව වෙනස් වූ දිනයේ සිට ව්‍යවහාර කිරීම සිදු කළ යුතුය. නමුත් සංස්ථාව විසින් 2019 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණයෙන් ක්ෂය වූ මොටර් රථ 02 ක සහ තවත් මෝටර් රථ 06 ක ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය සහ අවශේෂ වටිනාකම වෙනස්කිරීම තුළින් සිදුවූ ගිණුම්කරණ බලපෑම රු.මිලියන 2.79 ක් ලෙස හඳුනාගෙන එය අතීතයානුයෝගී ව්‍යාවහාරයක් ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි. | කිරීමක් ලෙස සලකා ඇති බව. | |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඖෂධ තොගයක ඉන්වොයිස් වටිනාකම වූ රු.749,212 ක් දෙවරක් ගිණුම්ගත කර තිබුණු බැවින් ඊට සමාන අගයකින් මාර්ගස්ථ තොග ගිණුම හා ණයහිමි පාලන ගිණුම වැඩියෙන් දක්වා තිබුණි. | මෙම ගණනය කිරීමේ දෝෂය ඉදිරි වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | 2020 වර්ෂයේදී මෙම වරද නිවැරදි කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට ඉතිරි තොගයේ පිරිවැය රු.873,304 කින් අඩුවෙන් ගණනය කර ගිණුම් ගත කර තිබුණි. | රඳවා තබා ගන්නා තොග වාර්ෂික තොග ගණනයේදී සාමාන්‍යයෙන් විකිණිය නොහැකි තොග ලෙස හඳුනාගන්නා බව. | -එම- |
| (ඇ) | ඔසුසැල් 39 ක් වෙනුවෙන් මිලදී ගෙන 2019 දෙසැම්බර් 31 දින වන විට ප්‍රධාන ගබඩාව වෙත ලැබී තිබුණු පිරිවැය රු.මිලියන 20.62 ක් වූ ඖෂධ තොගය ගිණුම්ගත කර නොතිබුණි. | මෙලෙස එකතු වී ඇත්තේ වසර අවසානයේදී බැවින් බෙදාහැරීම් ප්‍රමාද වූ බව. | -එම- |
| (ඈ) | 2019 දෙසැම්බර් 31 දිනට ඉතිරි තොගය තුළ ඇතුළත් තත්ත්වයෙන් අසමත් තොගයක පිරිවැය රු.552,498 ක් ලාභයට එරෙහිව කපා හැර නොතිබුණි. | වරද නිවැරදි කිරීමට අවස්ථාවක් ලබාදෙන ලෙස ඉල්ලා සිටින බව. | -එම- |
| (ඉ) | 2019 දෙසැම්බර් 31 දිනට ඔසුසල්හි ඉතිරි තොගවල පිරිවැය හා එම තොගවල හුවමාරු වටිනාකම අතර වෙනස හඳුනාගෙන එය නොඉපයූ ලාභ ලෙස ගැලපිය යුතු වුවත්, ඉතිරි තොගවල පිරිවැය හඳුනාගෙන නොතිබුණු අතර තොග හුවමාරු වටිනාකමින් සියයට 7.42 කට සමාන රු.මිලියන 47.81 ක් පමණක් නොඉපයූ ලාභ ලෙස වෙන්කර තිබුණි. | මෙහිදී පිරිවැය පදනම් කර නොගන්නා බව හා අදාළ ලාභ ප්‍රතිශතය මගින් ගණනය කරන ලද ඇස්තමේන්තුගත වටිනාකම සාමාන්‍ය තොගයන් ඉවත් කිරීමට සිදුවන බව. | ඔසුසල්හි ඉතිරි තොගවල පිරිවැය හා එම තොගවල හුවමාරු වටිනාකම අතර වෙනස හඳුනාගෙන එය නොඉපයූ ලාභ ලෙස ගැලපිය යුතුය. |

**1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විෂයය | මූලා ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | | |
| (අ) | වෛද්‍ය සැපයීම් අංශයෙන් ලැබිය යුතු ණය | 27,855 | 27,988 | 133 | වෛද්‍ය සැපයුම් අංශයෙන් ලබාගත් ශේෂය ලබාදෙන අවස්ථාවේදී සැසදීම සඳහා සංස්ථාවේ අවසාන ගිණුම යාවත්කාලීන කර නොතිබුණු බව. | මෙම වෙනසට හේතු හඳුනාගෙන මූලා ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් කළ යුතුය. |
| (ආ) | ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ණය | 1.6 | 0.87 | 0.73 | ආයුර්වේද දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම අනුව ණය ශේෂය රු.876,554 ක් ලෙස ජාතික විගණන කාර්යාලය වෙත ඔවුන් විසින් දන්වා තිබුණ නමුත් ඒ බව සංස්ථාව වෙත දන්වා නොමැති බව. | -එම- |
| (ඇ) | 2019 දෙසැම්බර් 31 දිනට තත්ත්වයෙන් අසමත් වී තිබුණු ඔසුසල් මගින් අලෙවිකිරීම සඳහා මිලදී ගෙන තිබුණු ඖෂධවල පිරිවැය | 116.86 | 96.63 | 20.23 | වෙනසට හේතු සොයා බැලීම සඳහා සිදුකරන විමර්ශනයෙන් පසුව වෙනස ලියාහැරීමට හා ඉදිරි කටයුතු සිදුකිරීමට කටයුතු කරන බව. | වෙනසට හේතු හඳුනාගැනීමට, අවශ්‍ය ගැලපීම් කිරීමට හා අදාළ පරිදි මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |
| (ඈ) | 2019 දෙසැම්බර් 31 දිනට ඉතිරි තොගයේ පිරිවැය | 1,497.1 | 1,511.0 | 13.9 | 'ජීවනී' නිෂ්පාදන ඒකකයේ ඉතිරි තොග අගය කළ පිරිවැය හා පරිගණක වාර්තාවේ ඇතුළත් පිරිවැය එකිනෙකට වෙනස්වීම මෙම | වෙනසට හේතු හඳුනාගැනීමට හා අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | | වෙනසට හේතුවී ඇති බව, සමහර අයිතම වල පිරිවැය පරිගණක වාර්තාවේ සටහන්වී නොමැති බව හා පරිගණක වාර්තාවේ සටහන් ඇතැම් අයිතමවල ප්‍රමාණ භෞතික තොග සමීක්ෂණ වාර්තාවල ප්‍රමාණයට වඩා වෙනස් බව. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | **රු.මිලියන** | | | |
| වෙළඳ ණයහිමි ශේෂ 149 ක් | 750.7 | ශේෂ සනාථ කිරීම් | අදාළ පසු ගෙවීම් විස්තර මේ වන විට විගණන අංශයට ලබාදී ඇති බව. | ශේෂ සනාථ කිරීම් විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |

### 1.5.5 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෛද්‍ය සැපයීම් අංශයෙන් ලැබිය යුතු රු.මිලියන 27,854.82 ක ශේෂයෙන් රු.මිලියන 211.59 ක් වර්ෂ 10 ත් වර්ෂ 21 ත් අතර කාලයක් පැරණි ණය ශේෂ විය. | පැරණි ණය ශේෂ භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතුව ලියාහැරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | පැරණි ණය ශේෂ පියවා ගැනීමට හෝ විධිමත් අනුමැතිය සහිතව ලියා හැරීමට හෝ කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විකුණු දින සිට දින 30 ත් දින 45 ත් අතර කාලය තුළදී වෙළඳ ණයගැතියන්ගේ ණය අයකර ගැනීම සංස්ථාවේ ප්‍රතිපත්තිය විය. නමුත් 2019 දෙසැම්බර් 31 දිනට වූ රු.මිලියන 1,341.85 ක ණය ශේෂය තුළ පුද්ගලික, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලින් රු.මිලියන 12.79 ක් වර්ෂ 5කට වැඩි කාලයක සිටද, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවෙන් රු.මිලියන 14.62 ක් වර්ෂයකට වැඩි කාලයක සිටද හිඟව පැවතුණි. ඉන් රු.මිලියන 3.14 ක ණය ශේෂ අයකර ගැනීම සඳහා පමණක් නීතිමය පියවර ගෙන තිබුණි. | වර්ෂ 05 කට වැඩි පුද්ගලික, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන වලින් ලැබිය යුතු රු.මිලියන 12.79 න් රජයේ රෝහල් වලින් හා අනෙකුත් ආයතන වලින් අයවිය යුතු අගය රු.මිලියන 2.08 ක් බව, රු.මිලියන 3.14 ක් අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගෙන ඇති බව, පාර්ලිමේන්තුවෙන් අයවිය යුතු රු.මිලියන 14.62 අයකර ගැනීම සඳහා කථානායකතුමා, සෞඛ්‍ය ලේකම්තුමා ඇතුළු අදාළ පාර්ශවයන් සමඟ කිහිප වතාවක් සාකච්ඡා කළද මෙම හිඟ මුදල පියවීම සම්බන්ධයෙන් සතුටුදායක පිළිතුරක් නොලැබුණු බව හා මෙම අයකර ගැනීම පිළිබඳව ගැටලුවක් ඇති නිසා මෙම මුළු අගයටම බොල් සහ අඩමාන ණය වෙන් කිරීමක් කර ඇති බව. | සංස්ථාවේ ප්‍රතිපත්තිය අනුව ණය අය කර ගතයුතු කාලසීමාව තුළ හා ගිවිසුම් ප්‍රකාරව ණය අයකරගැනීම කාර්යක්ෂම කළ යුතුය. |

## 1.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම්

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| (i) | මුදල් රෙගුලාසි 103, 104 හා 105 | (i) සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 21 කදී සංස්ථාව සතු වාහන 10 කට සිදුව තිබුණු අනතුරු සම්බන්ධයෙන් ප්‍රාරම්භක පරීක්ෂණ හා පූර්ණ පරීක්ෂණ පවත්වා වගකිව යුත්තන් නිශ්චය කිරීමටද එම පරීක්ෂණ වාර්තා අදාළ පාර්ශව වෙත ඉදිරිපත් කිරීමටද කටයුතුකර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් කටයුතු කළ ආකාරය පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් විගණනයට ඉදිරිපත් කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 571 | 2019 දෙසැම්බර් 31 දිනට පැවති, තැන්පත් කළ දින සිට වර්ෂ 2 ඉක්මවා තිබුණු එකතුව රු.මිලියන 1.91 ක තැන්පතු නිරවුල් කිරීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | හිමිකම් නොපාන වර්ෂ 3කට වැඩි තැන්පතු ආනයන අංශයෙන් තහවුරු කිරීමෙන් පසු ආදායමට බැර කිරීමට කටයුතු කරන බව. | -එම- |

## 2 මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 2.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රධාන ගබඩාවේ ඉතිරි තොග පැවතියදී ඒ පිළිබඳව නොසළකා කටයුතු කරමින් සමාලෝචිත වර්ෂය තුළදී එක් එක් ඔසුසැල් වෙනුවෙන් ඖෂධ මිලදී ගෙන තිබුණු බව ඖෂධ අයිතම 20 ක නියැදියක් සම්බන්ධයෙන් සිදුකළ පරීක්ෂණයේදී අනාවරණය විය. මේ හේතුවෙන් ලබා ගත හැකි වට්ටම් වාසි අහිමිවීම හෝ අඩුවීම මෙන්ම වැඩි මිලට මිලදී ගැනීමටද සිදුවී තිබුණි. නියැදිය තුළ වූ ඖෂධ අයිතම 20 න් අයිතම 05 කට අදාළ පිරිවැය රු.186,758 ක්වූ තොග කල් ඉකුත්වීමට මෙය හේතුවක් වී තිබුණි. | එක් එක් මිලදීගැනීමට පසුබිම් වූ කරුණු සහ නිරීක්ෂණ පරීක්ෂා කර බලා නිශ්චිත පිළිතුරක් ලබාදීමට බලාපොරොත්තු වන බව. | සමස්ථ අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන උපරිම වට්ටම් වාසි ලබා ගත හැකි වන පරිදි මිලදී ගැනීම් සිදුකළ යුතු අතර ඖෂධ තොග කල් ඉකුත්වීමට ඇති හැකියාව අවම කර ගත යුතුය. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට මාර්ගස්ථ තොග ගිණුමේ කාල විශ්ලේෂණයට අනුව පිරිවැය රු.619,720 ක්වූ තොග මාස හයකට වඩා වැඩි කාලයක් මාර්ගස්ථ තොග ලෙස පවතින බව තහවුරු විය. වෛද්‍ය සැපයුම් අංශය විසින් භාරගත් තොග වෙනුවෙන් හරපත් නිකුත් කිරීමේ ප්‍රමාදය සහ වෛද්‍ය සැපයුම් අංශය භාර නොගත් තොග භාර නොගැනීමට හේතු සොයා බලා පිළියම් නොයෙදීම හේතුවෙන් එම තොග දීර්ඝ කාලයක් තිස්සේ මාර්ගස්ථ තොග ලෙස පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව. | වෛද්‍ය සැපයුම් අංශය විසින් භාරගත් තොග වෙනුවෙන් හරපත් නිකුත් කිරීමේ ප්‍රමාදය සහ භාර නොගත් තොග භාර නොගැනීමට හේතු නිරීක්ෂණය වන පරිදි පද්ධතිය සැකසිය යුතුය. |
| (ඇ) | 2019 දෙසැම්බර් 31 දිනට බහාලුම් තැන්පතු ගිණුමේ ශේෂය රු.මිලියන 11.74 ක්වූ අතර ඉන් රු.මිලියන 6.44 ක් වර්ෂ 2 ත් වර්ෂ 12ත් අතර කාලයක සිට අයවිය යුතුව තිබුණි. ඉන් රු.මිලියන 5.44 කින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී අයකර ගත නොහැකිවී තිබුණි. | වර්ෂ 2 ත් වර්ෂ 12 ත් අතර කාලයට අදාළව පමණක් සැලකූ විට අයවිය යුතු රු.මිලියන 6.44 තුළ, ගිණුම් වලින් කපා හැරීමට නියමිත රු.මිලියන 5.7 ක්ද ඇතුළත් බව. | බහාලුම් තැන්පතු අයකර ගැනීම කාර්යක්ෂම කළ යුතුය. |
| (ඇ) | 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු බැංකු බිල්පත් ගිණුමේ ශේෂය රු.මිලියන 12,916.92 ක් විය. ඉන් | වර්ෂ 03 කට වඩා වැඩි කාලයක් පවතින වටිනාකම් නිශ්චය කරගැනීමෙන් පසුව ආදායමට | මෙම වටිනාකම් පිළිබඳව සොයා බලා නිරවුල් කිරීමට |

| | | | |
|---|---|---|---|
| | රු.මිලියන 34.28 ක් වර්ෂ 3 කට වඩා වැඩිකාලයක්ද, රු.මිලියන 104.22 ක් වර්ෂ 2 කට වඩා වැඩි කාලයක්ද පැරණි සැපයුම්කරුවන්ට නොගෙවූ සියයට සියයක ණයවර ලිපි වටිනාකම හා රැඳවුම් මුදල් වලින් සමන්විත වී තිබුණි. | ගැනීමට කටයුතු කරන බව. | හෝ ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු නියෝජිත කොමිස් ගිණුමේ බැර ශේෂය රු.මිලියන 31.69ක් විය. ඉන් රු.මිලියන 6.65 ක් වර්ෂ 3 කට වැඩි කාලයක්ද, රු.මිලියන 14.27 ක් වර්ෂ 2 කට වැඩි කලයක්ද දේශීය නියෝජිතයන් වෙත නොගෙවූ කොමිස් මුදල්වලින් සමන්විත වී තිබුණි. තවද වර්ෂ 2 කට වැඩි කාලයක සිට මෙම ගිණුමෙහි පවතින රු.මිලියන 13.46 ක්වූ හර ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නියෝජිත කොමිස් ගිණුමේ පවතින වර්ෂ 3 කට වඩා වැඩි හිමිකම් නොපාන බැර ශේෂ ආදායම් ලෙස ගිණුම් ගත කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව නොසැදුන හර ශේෂය වන රු.මිලියන 13.46, 2011 වර්ෂයට පෙර සිට පවතින පැරණි ශේෂයක් බැවින් පොත් වලින් ලියා හැරීම සඳහා කටයුතු කරන බව. | දිගුකාලයක් තුළදී නියෝජිතයන්ට නොගෙවූ මුදල් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කළ යුතු අතර හර ශේෂය පිළිබඳව සොයා බලා නිරවුල් කළ යුතුය. |

## 2.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංස්ථාවේ අලෙවිය සඳහා මිලදී ගෙන තිබුණු නමුත් 2019 ජනවාරි 01 දින වන විට තත්ත්වයෙන් අසමත්, කල්ඉකුත්වූ හා හානි වූ ඖෂධවල මුළු පිරිවැය රු.මිලියන 116.86ක්වූ අතර සමාලෝචිත වර්ෂය තුළදී තත්ත්වයෙන් අසමත්, කල්ඉකුත්වූ හා හානිවූ ඖෂධවල මුළු පිරිවැය රු.මිලියන 51.67ක් විය. ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී තත්ත්වයෙන් අසමත් ඖෂධවල මුළු පිරිවැය රු.මිලියන 24.63කින් රු.මිලියන 6.9 ක් 2020 මැයි 12 දින වන විටත් අයකරගෙන නොතිබුණි. තවද ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී ඖෂධ කල්ඉකුත්වීම හා හානිවීම නිසා සංස්ථාවට දැරීමට සිදුවී තිබුණු මුළුඅලාභය රු.මිලියන 83.79 ක් විය. | සමාලෝචිත වර්ෂයේ කල්ඉකුත්වූ ඖෂධවල පිරිවැය රු.මිලියන 36.97ක් වන බව හා ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ කල්ඉකුත්වූ ඖෂධවල පිරිවැය රු.මිලියන 74.2 ක්වන බව. | තත්ත්වයෙන් අසමත් ඖෂධවල වටිනාකම් සැපයුම්කරුවන් ගෙන් අයකර ගත යුතුය. ඖෂධ කල් ඉකුත්වීමට හේතු සොයාබලා පිළියම් යෙදීමට හා එම හේතුවලට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වෛද්‍ය සැපයුම් අංශයට තත්ත්වයෙන් අසමත් හා හානිවූ ඖෂධ සපයා තිබීම සහ ඖෂධ අඩුවෙන් සපයා තිබීම නිසා ඒවායේ පිරිවැය, පරිපාලන ගාස්තු හා එම තොග විනාශ කිරීමේ වියදම් | තත්වයෙන් අසමත් වීම් හා හානි වීම් සම්බන්ධයෙන් බොහෝ අවස්ථාවලදී සැපයුම්කරුවන් විසින් පැමිණිලි කරන බව හා ඒ සම්බන්ධයෙන් බේරුම්කරුවන් වෙත යාමට සිදුවන | සැපයුම්කරුවන් ගෙන් අයකර ගැනීම කාර්යක්ෂම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වශයෙන් 2019 දෙසැම්බර් 31 දින වන විට සැපයුම්කරුවන්ගෙන් අයකර ගත යුතුව තිබුණු රු.මිලියන 1,839.15 කින් රු.මිලියන 791.3 ක් 2020 ජුනි 30 දින වන විටත් අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. ඒ තුළ වූ රු.මිලියන 89.21 ක් අසාධු ලේඛනගත සැපයුම්කරුවන්ගෙන් අයකර ගත යුතු වූ බැවින් අයකිරීම් අවිනිශ්චිත විය. | බව, මේ නිසා භාණ්ඩ භාර ගන්නා අවස්ථාවේදී තත්ත්වය පරීක්ෂා කිරීමේදී හා ගබඩා කිරීමේදී නිසි ප්‍රමිතියට ගබඩා කර තිබේද යන්න තහවුරු කර ගැනීමේ වැඩපිළිවෙලක් ඉදිරියේදී හඳුන්වා දීමට කටයුතු කරන බව. | |
| (ඇ) | 2017, 2018 මෙන්ම 2019 වර්ෂයේදීද විවිධ හේතු මත නිකුත් නොකර රඳවා තබා ගෙන තිබුණු තොග අයිතම 21 ක පිරිවැය රු.මිලියන 16.22 ක් වූ තොග ඒකක 94,181 ක් නිදහස් කිරීම පිළිබඳව 2020 මැයි 31 දින වන විටත් තීරණ ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් එම තොග කල් ඉකුත්වීමේ හා හානි සිදුවීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය. 2017 අගෝස්තු 11 දින සිට රඳවා ගෙන තිබුණු පිරිවැය රු.739,931 ක Erythromycin Dry Syrup 125mg/5ml අයිතම ඒකක 8,739 ක් 2020 මැයි 20 දින රත්මලාන ගබඩාව තුළ කල් ඉකුත් වී තිබුණි. | අදාළ පිරිවැය සැපයුම්කරුවන් වෙතින් අයකර ගනු ලබන බව. | ඖෂධ කල් ඉකුත්වීමෙන් හා හානි වීමෙන් සිදුවන පාඩු අවම කරගැනීම සඳහා නිකුත් නොකර රඳවා තබාගන්නා අයිතම සම්බන්ධයෙන් වන තීරණ ගැනීම කාර්යක්ෂමව සිදුකළ යුතුය. |
| (ඈ) | ඉකුත් වර්ෂය තුළදී ක්‍රියාකාරීව පැවති ඔසුසල් 40 න් ඔසුසල් 24කින් ලැබී තිබුණු මුළු අලාභය රු.මිලියන 45.13ක් විය. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාකාරීවපැවති ඔසුසල් 46 න් ඔසුසල් 15 කින් ලැබී තිබුණු මුළු අලාභය රු.මිලියන 22.41ක් විය. | ඔසුසල් ශාඛා අතරින් සමහරක් වාණිජමය වශයෙන් ලාභදායී නොවන ස්ථාන වල ස්ථාන ගතවී ඇතත්, එයින් සැලසෙන මහජන සේවාව පවත්වාගෙන යාම අරමුණු කොටගෙන එම ස්ථානවල පවත්වාගෙන යාමට සිදුවී ඇති බව. | ඔසුසල් අලාභ අවම කිරීමටත් ලාභ ඉපයීමටත් අවශ්‍ය පියවර ගත යුතුය. |

## 2.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෛද්‍ය සැපයීම් අංශය සඳහා හදිසි දේශීය මිලදීගැනීම් සිදු කිරීමේදී, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු සුරක්ෂණයක් ලබා ගැනීමටද, 5.4.10 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව කාර්යයසාධන සුරක්ෂණයක් ලබා ගැනීමටද හා 8.9.1 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත් | හදිසි මිලදී ගැනීම් සඳහා ඉදිරිපත් වන ලංසුකරුවන්ට වර්ෂය සඳහාම ස්ථාවර ලංසු සුරක්ෂණයක් සහ කාර්යසාධන සුරක්ෂණයක් එකවර ලබාදීමට නියම කරන බව, දේශීය හා හදිසි මිලදි ගැනීම් සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදය | හදිසි දේශීය මිලදී ගැනීම් සඳහා අනුගමනය කළ යුතු මිලදී ගැනීම් ක්‍රියාපටිපාටි හා පිළිවෙත් නිශ්චයකර ඒ සඳහා නිසි අනුමැතින් ලබා |

| | | | |
|---|---|---|---|
| | ගිවිසුමකට එළඹීමටද කටයුතු කර නොතිබුණු අතර මෙම අංශය සඳහා අනුගමනය කළ යුතු මිලදී ගැනීම් ක්‍රියාපටිපාටි හා පිළිවෙත් නිශ්චයකර ඒ සඳහා වන ලිඛිත උපදෙස් හෝ මාර්ගෝපදේශ පිළියෙල කර නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන ඇති නමුත් එම ලියවිලි වල අඩංගු කරුණු අධ්‍යයනය කර දක්වා ඇති අඩුපාඩු මඟහරවා ගත හැකි පරිදි යාවත්කාලීන කරන ලද ක්‍රමවේදයක් ලේඛන ගත කිරීමට කටයුතු කරන බව. | ගෙන ලිඛිත උපදෙස් හෝ මාර්ගෝපදේශ පිළියෙල යුතුය. |
| (ආ) | 2018 සහ 2019 වර්ෂවල අවස්ථා 14 කදී වෛද්‍ය සැපයීම් අංශය සඳහා රු.මිලියන 891.18 ක් වැය කර වෙළඳ නාමය Herticad නමින්වූ Trastuzumab injection 440mg with solvent in 20ml vials 8, 945 ක් දේශීය වෙළඳපලේ එක් සැපයුම්කරුවෙකුගෙන් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| | (i) මෙම ප්‍රසම්පාදන අවස්ථා 14 න් අවස්ථා 13 ක ප්‍රසම්පාදන වටිනාකම රු.මිලියන 50 ඉක්මවා තිබුණු බැවින්, තාක්ෂණික ඇගයීමට විශේෂඥ වෛද්‍යවරුන් 02 දෙනෙකු ඇතුළු 05 දෙනෙකුගෙන් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුවක් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පත් කළ යුතු වුවත්, මෙම ප්‍රසම්පාදනය සඳහා තිදෙනෙකුගෙන් පමණක් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුවක් සංස්ථාව විසින් පත්කර තිබුණි. එම තාක්ෂණික ඇගයීම් කමිටුවට කිසිදු විශේෂඥ වෛද්‍යවරයෙකු පත්කරද නොතිබුණි. | ප්‍රාදේශීය මිලදී ගැනීම් හා හදිසි මිලදී ගැනීම් වලදී ලංසු ඇගයීම සඳහා තාක්ෂණ අංශයට ලබාදී ඇත්තේ දින 03 ක කාලයක් පමණක් නිසා තාක්ෂණික ඇගයීම් සඳහා සාමාජිකයන් 05 දෙනා රැස්වීමට කැඳවා ගැනීම ප්‍රායෝගිකව සිදු කළ නොහැකි බව, විශේෂයෙන්ම ජොෂ්ඨ විශේෂඥ වෛද්‍යවරු ඉතා කාර්යබහුල බැවින් ඔවුන්ව මේ සඳහා කැඳවා ගැනීම ඉතා අපහසු බව, මෙකී කරුණු සලකා බලා ඖෂධය ඉතා ඉක්මනින් රෝගීන් වෙත ලබා දීමේ අවශ්‍යතාවය මත තාක්ෂණික ඇගයීම් සඳහා එක් වෛද්‍යවරයෙකුගේ පමණක් නිර්දේශ ලබා ගැනීමට සංස්ථා සභාපති අනුමැතිය ලබා දී ඇති බව, ප්‍රසම්පාදන තාක්ෂණ ඇගයීම් සඳහා විශේෂඥ වෛද්‍යවරුන් නම් කිරීම සඳහා පාරදෘශ්‍ය ක්‍රමවේදයක් තිබී නොමැති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ වරින්වර යාවත්කාලීන කරනු ලැබ ඇති එහි සංශෝධනයන්ට අනුකූලව ප්‍රසම්පාදන කළමනාකරණය සිදු කළ යුතුය. එපරිදි කටයුතු නොකිරීම හේතුවෙන් සිදුවන හානි හෝ පාඩු වගකිව යුතු නිලධාරීන්ගෙන් අධිභාර කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේද සභාපතිවරයා වූ සංස්ථාවේ සභාපතිවරයා විසින්, තාක්ෂණික සහාය ලබාගැනීම සඳහා එක් විශේෂඥ වෛද්‍යවරයෙකුගේ නමක් නිර්දේශ කර තිබීම පදනම් කර ගෙන තාක්ෂණික ඇගයීම් කමිටු 13 සඳහා එක් විශේෂඥ වෛද්‍යවරයෙකුගේ සහාය පමණක් ලබා ගෙන තිබුණි. එම විශේෂඥ වෛද්‍යවරයා විසින් ලබාදී තිබුණු නිර්දේශය පදනම් කර ගෙන තාක්ෂණික ඇගයීම් කමිටුව තම නිර්දේශය ඉදිරිපත් කර තිබුණි. | හදිසි මිලදී ගැනීම් වල තාක්ෂණික ඇගයීම් ඉතා කෙටි කලක් තුළදී සම්පූර්ණ කළ යුතු අතර ඒ සඳහා විශේෂඥ වෛද්‍යවරු 02 ක් සහිත සාමාජිකයන් 05 දෙනෙකුගෙන් යුතු ඇගයීම් කමිටුවකින් නිර්දේශ ලබාගැනීම ප්‍රායෝගිකව අපහසු බව, මේ අනුව ඇගයීම් කටයුතු එක් විශේෂඥ වෛද්‍යවරයෙකුගෙන් පමණක් ලබා ගැනිමට සභාපතිවරයා විසින් ලබාදී තිබූ අනුමැතිය මත කටයුතු කර ඇති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ වරින්වර යාවත්කාලීන කරනු ලැබ ඇති එහි සංශෝධනයන්ට අනුකූලව ප්‍රසම්පාදන කළමනාකරණය සිදු කළ යුතුය. එපරිදි කටයුතු නොකිරීම හේතුවෙන් සිදුවන හානි හෝ පාඩු වගකිව යුතු නිලධාරීන්ගෙන් අයිහාර කළ යුතුය. |
| (iii) | ප්‍රසම්පාදන අවස්ථා 14 න් ප්‍රසම්පාදන අවස්ථා 06 ක්ම එක් විශේෂඥ වෛද්‍යවරයෙකු විසින්ද, තවත් අවස්ථා 02 බැගින් වෙනත් විශේෂඥ වෛද්‍යවරයින් දෙදෙනෙකු විසින්ද තාක්ෂණික ඇගයීම සිදුකර තිබුණි. | මෙම හදිසි මිලදී ගැනීම් ප්‍රසම්පාදනයන් වල තාක්ෂණික ඇගයීම් සඳහා විශේෂඥ වෛද්‍යවරුන් පත් කිරීම සිදු කරනු ලබන්නේ ආයතන ප්‍රධානියා විසින් බව, එසේ පත්කරන ලද වෛද්‍යවරයා ලබාදෙන නිර්දේශය ප්‍රසම්පාදන කමිටු තීරණය සඳහා ඉදිරිපත් කිරීම මෙහිදී සිදුවී ඇති බව. | -එම- |
| (iv) | තාක්ෂණික ඇගයීම් කමිටුවට සහාය ලබා දෙන විශේෂඥ වෛද්‍යවරයාට, අදාළ ඖෂධය සම්බන්ධයෙන් පෙර අත්දැකීම් නොමැති වීම මත ලංසු ප්‍රතික්ෂේප කිරීමට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙන් ප්‍රතිපාදන ලැබී නොතිබුණු නමුත් මෙම ප්‍රසම්පාදනයන් 14 දී අදාළ විශේෂඥ වෛද්‍යවරයා විසින් අවම ලංසුකරුගේ නිෂ්පාදන පෙර භාවිතා කර නොතිබුණු බවට කරන ලද නිර්දේශය පදනම් කර ගෙන ප්‍රසම්පාදන කමිටුව විසින් අවම ලංසු ප්‍රතික්ෂේප කර තිබීම හේතුවෙන් සංස්ථාවට දැරීමට සිදුව තිබුණු අතිරේක පිරිවැය රු.මිලියන 230.86 ක් විය. | මෙම පිළිකා ඖෂධ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී විශේෂඥ වෛද්‍යවරයෙකුගේ නිර්දේශ ලබා ගැනීමේ අරමුණ වනුයේ එකී ඖෂධයේ භාවිතය හා අනෙකුත් තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් වෛද්‍යවරයාගේ දැනුම හා අත්දැකීම් පදනම් කරගත් ඇගයීමක් ලබා ගැනීම බව, මෙම පිළිකා ඖෂධ අතුරු ආබාධ හා අනෙකුත් හානිකර ප්‍රතිඵල බහුල ඒවා වන බැවින් ඒ අනුව වෛද්‍යවරයාගේ නිර්දේශය මත පදනම්ව කටයුතු කිරීම හැර වෙනත් විකල්ප තාක්ෂණික ඇගයීම් කමිටුවට තිබී නැති බව. | මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (v) | වෙළඳ නාමය Herticad නමින් වූ Trastuzumab ඖෂධය ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් 2016 පෙබරවාරි 18 දින ප්‍රථම වරට ලියාපදිංචි කර තිබුණු අතර එතැන් සිට නොකඩවාම එම ඖෂධය මිලදී ගෙන තිබුණි. ඖෂධය සම්බන්ධයෙන් පෙර අත්දැකීම් නොමැති වීම මත අවම ලංසු ප්‍රතික්ෂේප කරන්නේ නම්, Herticad නමින් වූ Trastuzumab ඖෂධයද 2016 වර්ෂයේදී මිලදී ගැනීමට හැකියාවක් නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | -එම- |
| (vi) | 2018අගෝස්තු 31 දිනැති ගැසට් නිවේදනය මගින් Trastuzumab injection 440mg ඖෂධ ඒකකයක් සඳහා රු.95,000 ක උපරිම පාලන මිලක් නියම කර තිබුණු නමුත් 2018 සැප්තැම්බර් 04 දින නිකුත් කර තිබුණු ගැනුම් ඇණවුමට අදාළ Trastuzumab ඖෂධ ඒකක 500 ක් සඳහා ඒකකයකට රු.135,900 බැගින් මුදල් ගෙවා තිබුණි. පාලන මිලට වඩා වැඩියෙන් ගෙවා තිබුණු මුළු මුදල රු.මිලියන 20.45ක් විය. | ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය ලබාදුන් 2018 අගෝස්තු 23 දිනට පසුව ඖෂධයේ ටෙන්ඩර් මිල පාලනය කර ඇති බව, මේ සම්බන්ධයෙන් එවකට සිටි සභාපතිතුමාගේ (ප්‍රසම්පාදන කමිටු සභාපතිවරයාගෙන්) ලබාගත් උපදෙස් මත ජාතික ඖෂධ නියාමන අධිකාරියෙන් උපදෙස් ලැබුණු පසු ඒ අනුව ගෙවීම සිදුකර ඇති බව. | මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | වෛද්‍ය සැපයුම් අංශය සඳහා Cefriaxone Injection 500mg ඖෂධයෙන් Vial එකක් රු.18.72 ක බැගින් Vials 80,000 ක් මිලදී ගැනීමේ ප්‍රධාන ඇණවුම ඉකුත් වර්ෂයේදී නිකුත් කර තිබුණු අතර තොගය ප්‍රමාදවී සපයා තිබුණි. ඒ හේතුවෙන් ඇතිවී තිබුණු තොග හිඟය වලක්වා ගැනීම සඳහා එම ඖෂධයෙන් ඒකක 10,998 ක් දේශීය වෙළඳපලෙන් Vial එකක් රු.490 බැගින් මිලදී ගැනීමට සිදුවී තිබුණි. ඒ අනුව සංස්ථාවට දැරීමට සිදුවී තිබුණු අතිරේක පිරිවැය රු.මිලියන 5.18 ක් විය. ඇණවුම් කොන්දේසි ප්‍රකාරව, සැපයුම්කරුගේ ප්‍රමාදය හේතුවෙන් දැරීමට සිදුවී තිබුණු අතිරේක පිරිවැය සැපයුම්කරුගෙන් අයකර ගෙන නොතිබුණි. | ප්‍රධාන ඇණවුමට අදාළ මුදල සැපයුම්කරු වෙත ගෙවා නොමැති බව, එම ප්‍රධාන ඇණවුමේ මුළු මුදලද ඉක්මවා ඇති අතිරේක පිරිවැය සැපයුම්කරුගෙන් අයකර ගැනීම සඳහා හරපතක් නිකුත් කර ඒ පිළිබඳව කටයුතු කරමින් පවතින බව. | අතිරේක පිරිවැය සැපයුම්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | Cefuroxime for Injection USP 750 mg ඖෂධයෙන් 2018 වර්ෂයේ අවශ්‍යතාවය ලෙස හඳුනාගෙන තිබුණු vial එකක පිරිවැය රු.29.46 ක් හා මුළු පිරිවැය රු.මිලියන 58.93 ක්වූ vials මිලියන 2ක් මිලදී ගැනීම | | |

| | | |
|---|---|---|
| සඳහා 2018 වර්ෂයේදී ප්‍රධාන ගැණුම් ඇණවුම නිකුත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) සැපයුම්කරු විසින් 2018 ජූලි 18 දින මෙම ඖෂධ vials 2,000,000 ක් සපයා තිබුණු නමුත් vials 1,914,500 ක් සඳහා පමණක් රු.මිලියන 58.52 ක ඉන්වොයිසියක් එවා තිබුණි. ඉන්වොයිසියේ සඳහන් ප්‍රමාණය ඉක්මවා සපයා තිබුණු Vials 85,500 වෛද්‍ය සැපයීම් අංශය විසින් භාරගෙන නොතිබීම හා සැපයුම්කරු විසින් එම තොගය ආපසු ගෙන ගොස් නොතිබීම හේතුවෙන් පිරිවැය රු.මිලියන 2.51 ක් වූ Vials 85,500 පෞද්ගලික ගබඩාවක රඳවා තිබුණු අතර ඒවා භාවිතා කළ නොහැකි තත්ත්වයට පත්වී තිබුණි. | ඉන්වොයිසියේ සඳහන් ප්‍රමාණය ඉක්මවා සපයා තිබුණු Vials 85,500 භාරගැනීම වෛද්‍ය සැපයීම් අංශය විසින් ප්‍රතික්ෂේප කිරීම නිසා මේ තත්ත්වය ඇතිවූ බව. | මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) සපයා තිබුණු vials 1,914,500 න් Vials 100,000 ක කාණ්ඩයක් United State Pharmacopeia ප්‍රමිතියට අනුගත නොවන බැවින් වෛද්‍ය සැපයීම් අංශය විසින් බෙදාහැරීම අත්හිටුවා තිබුණු අතර ඒ වෙනුවෙන් සැපයුම්කරුගෙන් අයකරගත යුතු රු.මිලියන 2.94 සහ අදාළ ගාස්තු අයකරගෙන නොතිබුණි. | vials 1,914,500 2018 ජූලි 18 දින සපයා තිබුණු නමුත් බෙදාහැරීම අත්හිටුවීම 2019 අප්‍රේල් 5 දින සිදුකර ඇති බව. | -එම- |
| (iii) 2018 ජූලි 18 දින සපයා තිබුණු නමුත් ඉන්වොයිස් කර නොතිබුණු Vials85,500 ක් වෛද්‍ය සැපයීම් අංශය විසින් භාර ගෙන නොතිබීම, 2019 අප්‍රේල් 05 දින Vials 100,000 ක් තත්ත්වයෙන් අසමත්වී තිබීම හා 2019 වර්ෂයේ අවශ්‍යතාවය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාදවී තිබීම හේතුවෙන් ඇතිවී තිබුණු තොග හිඟය වලක්වා ගැනීම සඳහා 2019 වර්ෂය තුළදී Vials 375,000 ක් දේශීය වෙළඳපලින් මිලදී ගෙන තිබුණි. 2018 වර්ෂයේ අවශ්‍යතාවය සඳහා වූ ප්‍රධාන ඇණවුම මගින් රු.29.46 කට මිලදී ගෙන තිබුණු Vial එකක් ප්‍රධාන ඇණවුම සැපයූ සැපයුම්කරුගේ දේශීය නියෝජිතයාගෙන් රු.125.50 බැගින් Vials 352,000 ක්ද, ඉතිරි Vials | සමාලෝචිත වර්ෂය තුළදී වයල් 375,000 ක් දේශීය වශයෙන් මිලදී ගැනීම මෙම ප්‍රධාන ඇණවුමෙහි ප්‍රමාදයක් නිසා සිදු නොවුවක් වන බව, එබැවින් වයල් 375,000ක් දේශීයව මිලදී ගැනීමට අදාළ අතිරේක පිරිවැය මෙම සැපයුම්කරුගෙන් අයකර ගත නොහැකි බව, USP ප්‍රමිතියට අනුගත නොවීමෙන් බෙදාහැරීම අත්හිටවූ වයල් 100,000 වෙනුවෙන් තත්වයෙන් අසමත් ඖෂධ සම්බන්ධයෙන් වර්තමානයේදී අනුගමනය කරන ක්‍රියාවලියට අනුව අයකිරීම් සිදුකරනු ලබන බව. | මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| 23,000 Vial එකක් රු.190 බැගින් වෙනත් සැපයුම්කරුවෙකුගෙන්ද මිලදී ගෙන තිබීම හේතුවෙන් වැය කර තිබුණු අතිරේක පිරිවැය රු.මිලියන 37.49 ක් විය. Vials 85,500 ක තොගය භාර ගැනීමටත්, තත්ත්වයෙන් අසමත් Vials 100,000 වෙනුවට අළුත් Vials 100,000 ක් ලබා ගැනීමට හෝ ඒ සඳහා ගෙවූ මුදල් ආපසු අයකර ගැනීමටත්, 2019 වර්ෂයේ අවශ්‍යතාවය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාදයකින් තොරව සිදුකිරීමටත් කටයුතු කලේ නම් මෙම අතිරේක පිරිවැය අවම කර ගත හැකිව තිබුණු නමුත් එපරිදි කටයුතු කර නොතිබුණි. | | |
| (ඉ) සමාලෝචිත වර්ෂයේදී ඇණවුම් පිරිවැය රු.මිලියන 70.98 ක් වූ Bevacizumab Injection 100 mg ඖෂධයෙන් Vials 2,127 ක් මිලදී ගැනීම සඳහා ඇණවුම් දෙකක් නිකුත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) ප්‍රසම්පාදන වටිනාකම රු.මිලියන 50 ඉක්මවා තිබුණු බැවින්, තාක්ෂණික ඇගයීමට විශේෂඥ වෛද්‍යවරුන් 02 දෙනෙකු ඇතුළු 05 දෙනෙකුගෙන් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුවක් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පත් කළ යුතු වුවත්, මෙම ප්‍රසම්පාදනය සඳහා තිදෙනෙකුගෙන් පමණක් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුවක් සංස්ථාව විසින් පත්කර තිබුණි. එම තාක්ෂණික ඇගයීම් කමිටුවට කිසිදු විශේෂඥ වෛද්‍යවරයෙකු පත්කරද නොතිබුණි. | ප්‍රාදේශීය මිලදි ගැනීම් හා හදිසි මිලදි ගැනීම්වලදී ලංසු ඇගයීම සඳහා තාක්ෂණ අංශයට දින 03 ක කාලයක් පමණක් ලබාදී ඇති බැවින් තාක්ෂණික ඇගයීමේ රැස්වීම් සඳහා සාමාජිකයන් 05 දෙනෙකු කැඳවා ගැනීම ප්‍රායෝගිකව සිදු කළ නොහැකි බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව ප්‍රසම්පාදන කළමනාකරණය සිදු කළ යුතුය. එපරිදි කටයුතු නොකිරීම හේතුවෙන් සිදුවන හානි හෝ පාඩු වගකිව යුතු නිලධාරීන්ගෙන් අයිහාර කළ යුතුය. |
| (ii) සංස්ථාවේ සාමාන්‍යාධිකාරීවරයා විසින්, තාක්ෂණික සහාය ලබා ගැනීම සඳහා එක් විශේෂඥ වෛද්‍යවරයෙකුගේ නමක් නිර්දේශ කර තිබීම පදනම් කර ගෙන තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා එක් විශේෂඥ වෛද්‍යවරයෙකුගේ සහාය පමණක් ලබා ගෙන තිබුණි. එම විශේෂඥ වෛද්‍යවරයා විසින් ලබාදී තිබුණු නිර්දේශය පදනම් කර ගෙන තාක්ෂණික ඇගයීම් කමිටුව තම නිර්දේශය ඉදිරිපත් කර තිබුණි. | 2018 අග භාගයේදී සභාපති සේවයට නොපැමිණි බැවින් සහ ඖෂධයේ හදිසි අවශ්‍යතාවය සලකා සාමාන්‍යාධිකාරීවරයා විසින් විශේෂඥ වෛද්‍යවරයා නිර්දේශ කර ඇති බව, තාක්ෂණික ඇගයීම් සඳහා එක් වෛද්‍යවරයෙකුගේ නිර්දේශය පමණක් ලබා ගැනීමට එවක සිටි සභාපති අනුමැතිය ලබාදී | -එම- |

| | | | |
|---|---|---|---|
| | | ඇති බව, තාක්ෂණික ඇගයීම් සඳහා විශේෂඥ වෛද්‍යවරුන් නම් කිරීමේ පාරදෘශ්‍ය ක්‍රමවේදයක් තිබී නොමැති බව | |
| (iii) | තාක්ෂණික ඇගයීම් කමිටුවට සහාය ලබා දෙන විශේෂඥවෛද්‍යවරයාට, අදාළ ඖෂධය සම්බන්ධයෙන් පෙර අත්දැකීම් නොමැති වීම මත ලංසු ප්‍රතික්ෂේප කිරීමට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙන් ප්‍රතිපාදන ලැබී නොතිබුණු නමුත් මෙම ප්‍රසම්පාදනයේදී අදාළ විශේෂඥ වෛද්‍යවරයා විසින් අවම ලංසුකරුගේ නිෂ්පාදන පෙර භාවිතා කර නොතිබුණු බවට කරන ලද නිර්දේශය පදනම් කර ගෙන ප්‍රසම්පාදන කමිටුව විසින් අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුගෙන් Vials 532 ක්ද දෙවන අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුගෙන් Vials 1,595 ක්ද මිලදී ගැනීම නිර්දේශ කර තිබුණි. ඒ හේතුවෙන් සංස්ථාවට ඒකක 1,595 ක් මිලදී ගැනීම සඳහා ඒකකයට රු.6,500 බැගින් අතිරේකව වැය කිරීමට සිදුවී තිබුණු මුදල රු.මිලියන 10.36 ක් විය. | මෙම ප්‍රසම්පාදනයට අදාළව අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුගේ සාම්පල සම්බන්ධව අත්දැකීම් නොමැති බවට විශේෂඥ වෛද්‍යවරයා විසින් නිර්දේශ කර තිබුණු බව, රෝගීන්ගේ ආරක්ෂාව තහවුරු කර ගැනීම සඳහා ඉක්මනින් සැපයිය යුතු සැපයුම් සඳහා දෙවන සුදුසු මිල ගණන් ඉදිරිපත් කර ඇති පාර්ශ්වයෙන් මිලදී ගැනීමට සිදු වන බව, එසේ කිරීමේදී වැයවන අතිරේක පිරිවැය නොවැලැක්විය හැකි අතිරේක පිරිවැයක් වන බව. | -එම- |
| (iv) | ලංසු ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුවන් දෙදෙනාම ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි අදාළ ඖෂධය සම්බන්ධයෙන් ලියාපදිංචිය ලබා තිබුණු නමුත්, අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු ලංසුකරුගේ සාම්පල පමණක් TGA Australia ආයතනයෙන් පරීක්ෂාවක් සිදුකළ යුතු බවට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. එම තීරණය අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු ලංසුකරු වෙත දැනුම් දීම සඳහා දින 28 ක් ගත කර තිබුණි. | ප්‍රසම්පාදන තීරණය ලංසුකරු වෙත දැනුම් දීම සඳහා දක්වා ඇති කාල වකවානු ගතවී ඇති බව. | -එම- |

(ඊ) සමාලෝචිත වර්ෂය තුළදී ඇණවුම් පිරිවැය රු.මිලියන 79.2 ක් වූ Tropical Chlorinated Lime (TCL) අයිතමයෙන් කිලෝග්‍රෑම් 180,000 ක් මිලදී ගෙන තිබුණි. මෙ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (i) | ප්‍රසම්පාදන වටිනාකම රු.මිලියන 50 ඉක්මවා තිබුණු බැවින්, තාක්ෂණික ඇගයීමට විශේෂඥ වෛද්‍යවරුන් 02 දෙනෙකු ඇතුළු 05 දෙනෙකුගෙන් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුවක් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පත් කළ යුතු වුවත්, මෙම ප්‍රසම්පාදනය සඳහා තිදෙනෙකුගෙන් පමණක් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුවක් සංස්ථාව විසින් පත්කර තිබුණි. එම තාක්ෂණික ඇගයීම් කමිටුවට කිසිදු විශේෂඥ වෛද්‍යවරයෙකු පත්කරද නොතිබුණි. | මෙම ඇණවුමෙහි ඇස්තමේන්තු ගත පිරිවැය රු.මිලියන 20.17 ක් වන බව, සභාපතිවරයා නම් කරන 04 දෙනෙකු අතරින් සසම්භාවී ලෙස තාක්ෂණික අංශයට එක් විශේෂඥ වෛද්‍යවරයෙකු තෝරා ගෙන ඇති බව හා ඉදිරි වර්ෂයේ සිට තාක්ෂණික ඇගයීම් සඳහා විශේෂඥ මණ්ඩලයක් නම් කර එවීමට අදාළ විශේෂඥ සේවා සභාව විසින් සිදු කරන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව ප්‍රසම්පාදන කළමනාකරණය සිදු කළ යුතුය. එපරිදි කටයුතු නොකිරීම හේතුවෙන් සිදුවන හානි හෝ පාඩු වගකිව යුතු නිලධාරීන්ගෙන් අයිහාර කළ යුතුය. මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් විධිමත් ස්වාධීන පරීක්ෂණයක් පවත්වා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | තාක්ෂණික ඇගයීම් කමිටුවට යම් බාහිර උපදේශකයෙකුගේ සහාය ලබාගත හැකි වුවද මෙම Tropical Chlorinated Lime ප්‍රසම්පාදනයේ ලංසු ඇගයීම සඳහා ක්ෂුද්‍ර ජීවී විශේෂඥ වෛද්‍යවරියක් වෙත යවා තිබුණු නමුත් එම විශේෂඥ වෛද්‍යවරිය මෙම ලංසු ඇගයීම සඳහා තෝරා ගත් ආකාරය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. එසේම ඊට අදාළ පත්වීම් ලිපියක්ද එම වෛද්‍යවරිය වෙත නිකුත් කර නොතිබුණි. | මෙම කරුණු සම්බන්ධයෙන් එකඟ වන බව, එසේ වුවද එම විශේෂඥ වෛද්‍යවරිය සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමත විශේෂඥ වෛද්‍යවරුන්ගේ ලැයිස්තුවෙන් තෝරාගත් අයකු වන බව. | -එම- |
| (iii) | ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළදී උපදේශකවරයෙකු විසින් ඉටු කරනු ලබන යම් සේවාවක් තාක්ෂණික ඇගයීම් කමිටුවේ මාර්ගෝපදේශකත්වය සහ අධීක්ෂණය යටතේ සිදුවිය යුතු නමුත් මෙම ලංසු ඇගයීම එම ක්ෂුද්‍ර ජීවී විශේෂඥ වෛද්‍යවරිය විසින් පමණක් සිදුකර තිබුණි. | අඩු වටිනාකමින් යුත් ලංසු ඇගයීමේ සාමාන්‍ය ක්‍රමවේදය වන්නේ, ලංසුවට අදාළ අනෙකුත් තාක්ෂණික කරුණු විමසා සටහන් කිරීමෙන් පසුව විශේෂඥ මතය ලබා ගැනීම සඳහා විශේෂඥ වෛද්‍යවරයෙකු වෙත ඉදිරිපත් කිරීම බව, මෙහිදී තාක්ෂණික ඇගයීම් කමිටුව අදාළ මඟ පෙන්වීම සහ සහය එම වෛද්‍යවරියට ලබා දෙන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (iv) | TCL කිලෝග්‍රෑම් 1 කට ඉදිරිපත් කර තිබුණු රු.343.85 ක් වූ අවම ලංසුව තාක්ෂණික ඇගයීම සිදුකළ විශේෂඥ වෛද්‍යවරිය විසින් සාධාරණ පිළිගත හැකි හේතුවකින් තොරව ප්‍රතික්ෂේප කර තිබුණි. නිෂ්පාදන ලේබල්, භාවිතා කරන්නා සඳහා උපදෙස්, ආරක්ෂිත දත්ත හා Hazards සලකුණ පැවතීම යන අවශ්‍යතා ටෙන්ඩර් ලියකියවිලිවල හෝ අවශ්‍යතා පිරිවිතරයේ හෝ සඳහන් කර නොතිබුණු බැවින් එම අවශ්‍යතා සම්පූර්ණ නොකිරීම මත ලංසුවක් ප්‍රතික්ෂේප කළ නොහැකි වුවද, එම අවශ්‍යතා හතර සම්පූර්ණ කර නොතිබීම පදනම් කර ගෙන විශේෂඥ වෛද්‍යවරිය විසින් අවම ලංසුව ප්‍රතික්ෂේප කර තිබුණි. එසේම SLS 759-1986 ප්‍රමිතිය තුළද Hazards සලකුණු අවශ්‍යතාවයක් දක්වා නොතිබුණි. | නිර්දේශය පිළිබඳ තීරණය අදාළ අංශයේ විශේෂඥ වෛද්‍ය මතය මත රැඳෙනු ඇති බව, නිෂ්පාදන ලේබල් තිබීම හා භාවිතා කරන්නන් සඳහා උපදෙස්ද මෙම ගණයට වැටෙන නිෂ්පාදනයක තිබිය යුතු අනිවාර්ය අංගයන් බව, මුද්‍රිත කොන්දේසි අංක 14 යටතේ මෙම අවශ්‍යතා දක්වා ඇති බව. | -එම- |
| (v) | වෛද්‍ය සැපයුම් අංශය විසින් TCL සඳහා පිළියෙල කර තිබුණු පිරිවිතරයට අනුව, Tropical Chlorinated lime BP හි සියයට 30 කට අඩු නොවන ක්ලෝරීන් ප්‍රතිශතයක් තිබිය යුතු විය. අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු ලංසුකරුගේ සාම්පල පිළිබඳව කාර්මික තාක්ෂණ ආයතනය විසින් ලබාදී තිබුණු තත්ත්ව පරීක්ෂණ වාර්තාව අනුව ද්‍රව්‍ය සාම්පලයේ තිබුණු ක්ලෝරීන් ප්‍රතිශතය සියයට 39.4 ක් වූ බැවින් එම ලංසුව පිළිගැනීමට බාධාවක් නොතිබුණි. නමුත් අවම ලංසුවඅවශ්‍යතා පිරිවිතරවලට අනුකූල නොවන බව ලංසු ඇගයීම් වාර්තාවේ දක්වා තිබුණු අතර කුමන පිරිවිතරවලට අනුකූල නොවන්නේද යන්න පිළිබඳ නිශ්චිතව කරුණු දක්වා නොතිබුණි. | විශේෂඥ වෛද්‍යවරියගේ මතය සටහන් කිරීමේදී ටෙන්ඩර් කොන්දේසි වල අඩංගු කරුණු පැහැදිලිව සටහන් කර ඇති බව, කෙසේ වුවද ඉදිරි වසරේ සිට තාක්ෂණික ඇගයීම් සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් කරන ලද නිර්දේශ වලට අනුව නිර්ණායක මාලාවක් හඳුන්වා දෙනු ලබන බව හා ඒ අනුව සියලු තාක්ෂණික ඇගයීම් සිදු කළ යුතු බව. | -එම- |
| (vi) | විශේෂඥ වෛද්‍යවරියගේ නිර්දේශය මත පදනම්ව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලබා දී තිබුණු නිර්දේශය ප්‍රකාරව, වැඩිම ලංසුව වූ TCL කිලෝග්‍රෑම් 1 කට රු.440 ක් ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරු වෙත ප්‍රසම්පාදනය පිරිනැමීමට කටයුතු කර තිබුණි. ඒ හේතුවෙන් සංස්ථාවට | අවම ලංසුව ප්‍රතික්ෂේප කර අනෙක් ලංසුව ඉදිරිපත් කළ සැපයුම්කරුට ප්‍රදානය කිරීම තාක්ෂණික ඇගයීමේදී සලකා බලන ලද කරුණු මත සිදු වී ඇති බව, මෙහිදී අවම ප්‍රතිචාරාත්මක ලංසුකරුට | -එම- |

| | | | |
|---|---|---|---|
| | දැරීමට සිදුවන අතිරේක පිරිවැය රු.මිලියන 17.3 ක් විය. | ටෙන්ඩර් ප්‍රදානය කර ඇති බව. | |
| (vii) | කෙසේ වෙතත් ප්‍රසම්පාදනය පිරිනමා තිබුණු සැපයුම්කරු විසින් සපයා තිබුණු රසායනික ද්‍රව්‍ය අයිතමයේ සියයට 70 සිට සියයට 75 දක්වා වූ Chlorine ප්‍රතිශතයක් අඩංගු වී ඇති බව ලේබලයේ සඳහන්වී තිබුණු බවත්, සපයා තිබුණු ද්‍රව්‍ය අයිතමයෙහි Tropical Chlorinated lime යන්න සඳහන්වී නොතිබුණු බව හා ඒ වෙනුවට Chlorinated limeBP යනුවෙන් පමණක් සඳහන්වී තිබුණු බවත් 2020 මැයි 19 දින සිදුකළ භෞතික විගණන පරීක්ෂාවේදී අනාවරණය විය. ඒ අනුව සැපයුම්කරු විසින්, සංස්ථාව ඇනවුම් කරන ලද Tropical Chlorinated lime (TCL) වෙනුවට ලේබලයේ සඳහන්වූ පරිදි සියයට 70 සිට සියයට 75 දක්වා වූ Chlorine ප්‍රතිශතයක් අඩංගු Calcium hypochlorite සපයා තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වුවද විගණනයේ අවශ්‍යතාවය මත Tropical Chlorinated lime (TCL) තොගයෙන් ලබාගත් සාම්පල් පරීක්ෂාවෙන් පසු කාර්මික තාක්ෂණික ආයතනය විසින් (ITI) 2020 ජුලි 21 දින නිකුත් කර තිබුණු පරීක්ෂණ වාර්තාවට අනුව සපයා තිබුණු තොගයේ අඩංගු ක්ලෝරීන් ප්‍රතිශතය සියයට 66.5 ක් විය. | ඉදිරිපත් කර ඇති පරීක්ෂණ වාර්තා අනුව Tropical Chlorinated lime(TCL) සහ Chlorinated lime(BP) යනුවෙන් හඳුන්වන්නේ එකම අයිතමය බව. | -එම- |
| (viii) | එමෙන්ම 2018 වර්ෂයේදී Tropical Chlorinated lime (TCL) මිලදී ගැනීම සඳහාවූ ප්‍රසම්පාදනයේ තාක්ෂණික ඇගයීම සිදුකිරීමේදීද, ඉහතින් සඳහන් විශේෂඥ වෛද්‍යවරිය විසින් පෙර වර්ෂවලදී සැපයුම් සිදුකර තිබුණු නිෂ්පාදකයාගේම නිෂ්පාදනයන් සඳහා අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු ලංසුකරු නිෂ්පාදන ලේබල් නොවීම, ආරක්ෂිත දත්ත නොමැතිවීම, භාවිතා කරන්නන්ට උපදෙස් නොමැතිවීම, Hazards සලකුණ නොතිබීම හා පෙර පැමිණිලි ලැබී තිබීම යන හේතූන් මත ප්‍රතික්ෂේප කර වැඩිම ලංසුව ඉදිරිපත් කර තිබුණු ලංසුකරුව නිර්දේශ කර | අයිතමයේ නිර්දේශය පිළිබඳ තීරණය අදාළ අංශයේ විශේෂඥ වෛද්‍ය මතය මත රඳෙනු ඇති බව හා වඩාත් ප්‍රතිචාරාත්මක ලංසුව සඳහා ප්‍රසම්පාදනය පිරිනමා ඇති බව. | මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් විධිමත් ස්වාධීන පරීක්ෂණයක් පවත්වා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. ඒ අනුව 2018 වර්ෂයේදීද අවම ලංසුව ප්‍රතික්ෂේප කිරීම නිසා සංස්ථාවට දැරීමට සිදුවී තිබුණු අතිරේක පිරිවැය රු.මිලියන 39.58 ක් විය. | | |
| (ix) | මූලික ඇණවුමට අනුව Tropical Chlorinated lime (TCL) කිලෝ ග්‍රෑම් 120,000 ක් 2020 මැයි මාසය වන විට සපයා තිබිය යුතු වුවද, 2020 මැයි 19 දින සිදුකළ භෞතික විගණන පරීක්ෂාවේදී අදාළ සැපයුම්කරු විසින් එදින වන විටත් Calcium hypochlorite කිලෝ ග්‍රෑම් 25,200 ක් පමණක් සපයා තිබුණි. | සපයා ඇති අයිතමය ලේබන වලට අනුව Calcium hypochlorite නොවන බව සහ Chlorinated lime වන බව හා සැපයුම්කරු විසින් ඉන්ඩෙන්ටුවේ සඳහන් පරිදි සැපයීම් පැහැර හැරිය හොත් කොන්දේසි ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකර ගන්නා බව. | -එම- |
| (x) | 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ වර්ෂ 03 තුළදී Tropical Chlorinated lime (TCL) මිලදී ගැනීමේදී සංස්ථාව විසින් කිලෝ ග්‍රෑම් 1 ක් සඳහා වැයකර තිබුණු පිරිවැය පිළිබඳව සලකා බැලීමේදී, 2017 වර්ෂයේ මිලදී ගත් මිලට වඩා සියයට 57 ක් වැඩියෙන් 2018 වර්ෂයේදීද, 2018 වර්ෂයේ මිලදී ගත් මිලට වඩා සියයට 100 කින් වැඩි මිලකට 2019 වර්ෂයේදීද Tropical Chlorinated lime (TCL) මිලදී ගෙන තිබුණි. | තාක්ෂණික ඇගයීමේදී තෝරාගෙන නිර්දේශ කරන ලද අවම ප්‍රතිචාරාත්මක ලංසුකරුට ඇණවුම ප්‍රදානය කර ඇති බව. | -එම- |

**2.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංස්ථාවට ව්‍යවසාය සම්පත් සැලැස්මක් (Enterprise Resource Plan) ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් අදාළ කොන්ත්‍රාත්කරු සමඟ 2016 දෙසැම්බර් 19 දින එළඹ තිබුණු ගිවිසුම ප්‍රකාරව, කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 49.3 ක්වූ අතර 2018 පෙබරවාරි 19 දින වන විට ව්‍යාපෘතිය අවසන් කළ යුතු විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |

| | | | |
|---|---|---|---|
| (i) | දිගින් දිගටම ව්‍යාපෘතිය ඉටු කිරීමේ කාර්යසාධනය ඉතා පහළ මට්ටමක තිබුණු නමුත් ගිවිසුම් ගතවූ දින සිට වර්ෂ 03 කට අධික කාලයක් තිස්සේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. වර්ෂ 03 කට පසුව 2020 පෙබරවාරි 20 දින ගිවිසුම අවසන් කර (Terminate) තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව, දිගින් දිගටම ව්‍යාපෘතිය නියමිත කාල රාමුව තුළ සිදු නොකිරීම මත මේ වන විට ගිවිසුම අවසන් කිරීමට කටයුතු කර ඇති බව හා මේ සඳහා නැවතත් මිල ගණන් කැඳවා හැකි ඉක්මණින් එම ව්‍යාපෘතිය නිම කිරීමට අවශ්‍ය මූලික පියවර මේ වන විටද ගෙන ඇති බව. | කොන්ත්‍රාත් පරිපාලන කටයුතු රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව විධිමත්ව සිදුකළ යුතුය. ව්‍යාපෘතිය නිම කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය |
| (ii) | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2018 සහ 2019 වර්ෂවලදී රු.මිලියන 32.36 ක් වැය කර මිලදී ගෙන තිබුණු පරිගණක හා උපාංග අයිතම 09 කින් ඒකක 497 ක් ව්‍යාපෘති කටයුතු සඳහා පාවිච්චි කර නොතිබුණු අතර ඉන් පිරිවැය රු.මිලියන 15.56 ක් වූ පරිගණක උපාංග අයිතම 07 ක ඒකක 266 ක් සංස්ථාවේ වෙනත් කාර්යයන් සඳහා භාවිතයට නිකුත් කර තිබුණි. ඉතිරි පිරිවැය රු.මිලියන 16.79 ක්වූ පරිගණක හා උපාංග අයිතම 07 කින් ඒකක 231 ක් 2020 ජුනි 30 දින වන විටත් නිෂ්කාර්යව ගබඩා කර තිබුණි. | අදාළ අයිතම අවශ්‍ය වන පරිදි ඉදිරියේදි ඵලදායී ලෙස භාවිතයට ගැනීමට කටයුතු කරනු ලබන බව. | අදාළ අයිතම හැකි ඉක්මනින් ඵලදායී ලෙස භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | ගබඩාව තුළ වූ Server Computers 04 හි පැවති අඩුපාඩු නිසා Server Computers 04 ක් නැවත සැපයීමට කොන්ත්‍රාත්කරු එකඟ වී තිබුණද 2020 ජුනි 30 දින වන විටත් නැවත සපයා ගැනීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි. | දක්වා ඇති Server Computer නැවත සැපයීමට කොන්ත්‍රාත්කරු එකඟ වී ඇති නමුත් පසුගිය දිනවල පැවති වාතාවරණය මත එය ප්‍රමාද වී ඇති බව හා හැකි ඉක්මනින් එම Server Computer ලබාගැනීමට කටයුතු කරනු ලබන බව. | Server Computers 04 හැකි ඉක්මනින් ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| (iv) | වර්ෂ 03 කට අධික කාලයකට පසුව මෙම ව්‍යාපෘතිය අසාර්ථක වීම, ඔසුසැල් ක්‍රියාකාරීත්වය ඇතුළු සංස්ථාවේ සියළුම කටයුතු සම්බන්ධ දත්ත පද්ධතිය කෙරෙහි සෘජුවම අහිතකර ලෙස බලපා තිබුණි. | නිරීක්ෂණ සමග එකග වන බව, අදාළ ව්‍යාපෘතිය භාරගත් පාර්ශවයේ ප්‍රමදයන් හා මගහැරීම් එම තත්ත්වයට හේතුවී ඇති බව, එම තත්ත්වය මහහරවා ගැනීමට හැකි ඉක්මනින් නව ව්‍යාපෘතියක් හඳුන්වාදීමට කටයුතු කරනු ලබන බව. | ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට කටයුතු කළ යුතුය. |

3. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

3.1 සංයුක්ත සැලැස්ම හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 වර්ෂය සඳහා සමුච්චිත සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | අදාළ විෂය භාරව සිටි කළමනාකරණ ගණකාධිකාධිකාරිණිය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි ධූරයකට උසස්වීමෙන් පසුව කළමනාකරණ ගණකාධිකාධිකාරි තනතුර අහෝසි වූ බැවින් සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම මූලිකව සකස් කර ගැනීම අපහසු වී ඇති බව හා විකල්ප ක්‍රමවේදයක් අනුගමනය කරමින් එම සැලැසුම් හැකි ඉක්මනින් සකස් කිරීමට කටයුතු කරන බව. | සමුච්චිත සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඉදිරිපත් කළයුතුය. |